ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

காணி உபயோகக் கொள்கைத் திட்டமிடல் திணைக்களம்

Land Use Policy Planning Department

# 2017

# කාර්ය සාධන වාර්තාව

## செயற்திறன்அறிக்கை

# Performance Report

# පටුන


1.හැඳින්වීම ....................................................................................................02

1.1 දැක්ම....................................................................................................02

1.2 මෙහෙවර....................................................................................................02

1.3.අරමුණු....................................................................................................02

1.4.කාර්යභාරය....................................................................................................03

2. සංවිධාන ව්‍යුහය....................................................................................................04

3.මානව සම්පත් කළමනාකරණය....................................................................................................05

3.1 කාර්ය මණ්ඩල සංයුතිය....................................................................................................05

3.2 ස්ථාන මාරු වීම්....................................................................................................06

3.3 ආයතනික තොරතුරු....................................................................................................07

3.4 මානව සම්පත් සංවර්ධනය....................................................................................................08 -10

4. මූල්‍ය කළමනාකරණය....................................................................................................11

4.1.වැය ඇස්තමේන්තුව -2017....................................................................................................11

4.2.රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම ....................................................................................................11

4.3.අදායම් ගිණුම්....................................................................................................11

4.4.භෞතික සම්පත් කළමනාකරණය -2017....................................................................................................12-13

4.5.ගබඩා සමීක්ෂණ ....................................................................................................13

4.6.විගණන කටයුතු ....................................................................................................13

5.සංවර්ධන කටයුතු....................................................................................................14

5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම....................................................................................................14

5.2.දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම....................................................................................................15-17

5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම....................................................................................................17-19

5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය....................................................................................................19

5.5. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම....................................................................................................19-20

5.6. ඉඩම් පරිහරණ සැලසුම්කරණය පිළිබඳ පාසැල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම....................................................................................................21

5.7.වෙනත් ව්‍යාපෘති....................................................................................................22-26

5.8.දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල සාරාංශ ප්‍රගතිය....................................................................................................27

# ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 01.හැඳින්වීම

ශ්‍රී ලංකාව සඳහා විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම් ක්‍රමවේදයක් හඳුන්වාදීම සඳහා වර්ෂ 1983 දී ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් අංශය ඉඩම් හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශයේ ඒකකයක් වශයෙන් පිහිටුවන ලදී. මෙම විෂයයේ කාලීන වැදගත්කම හා කාර්යභාරය පුළුල් වීමත් සමගම මෙම ආයතනය 2010 වසරේ සිට දෙපාර්තමේන්තුවක් ලෙස උත්ශ්‍රේණි ගත කරන ලදී.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය නාරාහේන්පිට කොළඹ 05 ලිපිනයෙහි පිහිටා ඇති අතර දිස්ත්‍රික් කාර්යාල 25කින් යුක්ත වේ. මෙම දිස්ත්‍රික් කාර්යාල (කෑගල්ල සහ ගාල්ල හැර ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයන් තුල පිහිටා ඇත. සමස්ථ කාර්යමණ්ඩල පිලිබඳ විස්තර වගු අංක 3.1 යටතේ දක්වා ඇත.

ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු ප්‍රධාන කාර්යාලයේ උපදෙස් අනුව දිස්ත්‍රික් මට්ටමේ එක් එක් දිස්ත්‍රික්කවලට අනුයුක්ත සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) විසින් මෙහෙයවීම හා අධීක්ෂණය කරනු ලබන අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමට අනුයුක්ත ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හෝ සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. ජාතික මට්ටමේදී සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම හා මෙහෙයවීම අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදුකරනු ලබන අතර, ඒ සඳහා ප්‍රධාන කාර්යාල මට්ටමෙන් පත් කර ඇති විෂයානුබද්ධ (ඉඩම් පරිහරණ සැලසුම්, ශෂ්‍ය විද්‍යා, කෘෂි ආර්ථික විද්‍යා, සමාජ විද්‍යා හා තොරතුරු පද්ධති) නියෝජ්‍ය සහ සහකාර අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබාදෙනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා ප්‍රධාන වශයෙන් 2007 වර්ෂයේදී කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය, 2010 අංක 1654/21 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් දෙපාර්තමේන්තුවක් බවට පත්කිරීමේදී සඳහන්කර ඇති කාර්යයන් හා රජයේ සංවර්ධන ප්‍රමුඛතා පාදක කර ගැනේ.

### 1.1.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම

"ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත සහ තිරසාර ලෙස පරිහරණය කිරීම."

### 1.2.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ප්‍රකාශය

භූමිය පරිහරණය කරන්නන්ද ඇතුළුව අපගේ සියළු පාර්ශවකරුවන් තෘප්තිමත් වන සේ කාර්යක්ෂම මෙන් ම සේවයට කැප වූ කාර්ය මණ්ඩලයක් විසින් පාරිසරික සමතුලිතතාවය පවත්වා ගනිමින් තිරසාර සහ ප්‍රශස්ථ ලෙස භූමිය පරිහරණය කිරීමට ප්‍රතිපත්ති සම්පාදනය සහ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

### 1.3.ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු

2010 අංක 1654/21 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය පරිදි ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු 05 කි.

01. ශ්‍රී ලංකාව සඳහා සම්මත කර ගෙන ඇති ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය නෛතික පසුබිම සැකසීම.
02. ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම.
03. සීමිත සම්පතක් වූ භූමිය මානව යහපත පිණිසත්, පාරිසරික සමතුලිතතාවය රැකෙන පරිදිත් භාවිතා කිරීමට හැකි වනසේ උචිත තාක්ෂණික මග පෙන්වීම සිදු කිරීම.
04. භූමිය පදනම් කරගත් සංවර්ධන සැලසුම්වල දී එම සම්පතේ ආරක්ෂාව හා මතු පැවැත්ම තහවුරු වන පරිදි කටයුතු කිරීමට අදාළ නිර්දේශ නිකුත් කිරීම.
05. විද්‍යාත්මක භූමි පරිහරණ සැලසුම්කරණය පිළිබඳ දැනුම පුහුණුව හා අධ්‍යයනය පුළුල් වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

## 1.4 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය

මෙම දෙපාර්තමේන්තුවේ සියළුම කාර්යයන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.

(01). ප්‍රධාන කාර්යයන් වශයෙන් ගැනෙන විශාල මට්ටමින් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

(02). අතිරේක කාර්යයක් වශයෙන් සැලකෙන කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු

මේ පිළිබඳ විස්තර සැකවින් පහත දැක්වේ.

**<u>විශාල පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

පළාත් දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සිදු කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මේ යටතට ගැනේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සහ උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක සඳහා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව දිස්ත්‍රික් මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

**<u>කුඩා පරිමාණ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු</u>**

මේ යටතේ තෝරාගත් ග්‍රාමීය ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම, හායනයට පත්ව ඇති කෘෂිකාර්මික බිම් පුනරුත්ථාපනය සඳහා සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීමත්, රාජ්‍ය ආයතන හා රජයේ පාසැල් පරිශ්‍රයන්වල ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ස්ථාපිත කිරීමත් සහ විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව භාවිතා නොකර තිබෙන භූමි ප්‍රදේශ සඳහා භූමි යෝග්‍යතා අධ්‍යයන වාර්තා ලබා දීමත් සිදු කෙරේ.

**ඉහත ප්‍රධාන කාර්යයන්වලට අමතරව එම කාර්යයන් වඩාත් පහසු කිරීම සඳහා**

01. විවිධ මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා පාදකවන ඉඩම් තොරතුරු දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාම

02. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම.

03. ඉඩම් ප්‍රශස්ථ ලෙස භාවිත කිරීම පිළිබඳව රාජ්‍ය නිලධාරීන්, ගොවි ප්‍රජාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම.

04. ඉඩම් පරිහරණ ගැටළු අවම කිරීම සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් පරිහරණ කමිටු ස්ථාපිත කර පවත්වා ගෙන යාමද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ

# සංවිධාන ව්‍යුහය - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 02




■ - දරන්නාට පෞද්ගලික වනසේ

# 03.මානව සම්පත් කළමනාකරණය

## 3.1. කාර්ය මණ්ඩල සංයුතිය

| අනු අංකය | අනුමත තනතුරු නාම | තනතුරු සංඛ්‍යාව | පෙර වසරේ සිටි | 2017 වර්ෂය තුළ සිදු වූ වෙනස් වීම් | | | | | ප්‍රවර්තන වසරේ සිටි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විශ්‍රාම යෑම | ස්ථාන මාරු | | බඳවා ගැනීම් | උසස් වීම් | |
| | | | | | ගිය | පැමිණි | | | |
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | - | - | - | - | 01 |
| 2. | අධ්‍යක්ෂ (පාලන ) | 01 | - | - | - | 01 | - | - | 01 |
| 3. | අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) | 01 | - | - | - | - | - | - | - |
| 4. | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - | 01 |
| 5. | අභ්‍යන්තර විගණක | 01 | - | - | - | - | - | - | - |
| 6. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. | 04 | 02 | - | - | - | - | - | 02 |
| 7. | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ( තොරතුරු පද්ධති ) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 8. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 9. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශෂ්‍ය විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 10. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘෂි ආර්ථික විද්‍යා) | 01 | 01 | - | - | - | - | - | 01 |
| 11. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (දි.ඉ.ප.) | 25 | 23 | - | - | - | - | | 23 |
| 12. | පරිගණක පද්ධති විශ්ලේෂක/ වැඩ සටහන් සම්පාදක | 01 | 01 | - | - | - | - | - | 01 |
| 13. | ගණකාධිකාරී | 01 | 01 | - | - | - | - | - | 01 |
| 14. | රාජ්‍ය කළමනාකරණ සහකාර (අධි පන්තිය ) | 01 | - | - | - | - | - | - | - |
| 15. | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | 294 | 281 | - | - | - | - | - | 281 |
| 16. | සංවර්ධන නිලධාරී | 200 | 193 | - | ■ 05 | 01 | ★ 06 | - | 195 |
| 17. | අයවැය සහකාර | 01 | - | - | - | - | - | - | - |
| 18. | තොරතුරු සන්නිවේදන තාක්ෂණික සහකාර | 02 | 02 | - | - | - | - | - | 02 |
| 19. | රාජ්‍ය කළමනාකරණ සහකාර | 50 | 27 | 01 | ■ 05 | - | ★ 06 | - | 27 |
| 20. | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 11 | 11 | - | - | - | | - | 11 |
| 21. | රියදුරු | 34 | 28 | - | 02 | 03 | - | - | 29 |
| 22. | ශිල්පීය සහායක | 25 | 18 | - | - | - | - | - | 18 |
| 23. | කාර්යාල කාර්ය සහායක | 37 | 36 | 02 | - | - | - | • 02 | 32 |
| 24. | බංගලා භාරකරු | 01 | - | - | - | - | - | - | - |
| | එකතුව | 696 | 629 | 03 | 12 | 05 | 12 | 02 | 629 |

■ - මුදා හැරීම් 02ක් සහ ස්ථාන මාරු වීම් 03ක් ඇතුළත්

• - රා.ක.ස. සේවයට උසස්වීම් ලබා ඇත.

★ - රා.පරි. අමාත්‍යාංශය මඟින් බඳවා ගෙන මෙම දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කර ඇත.

# 3.2. ස්ථාන මාරු පිළිබඳ විස්තර

| අනු අංකය | නම හා තනතුර | ස්ථාන මාරු වී ගිය | | ස්ථාන මාරු වී පැමිණි | | |
|---|---|---|---|---|---|---|
| | | දිනය | රාජකාරි ස්ථානය | අනුප්‍රාප්තිකයාගේ නම | දිනය | රාජකාරී ස්ථානය |
| 1. | ඩබ්.එස්. දමයන්ති මිය සංවර්ධන නිලධාරී | 2017.10.09 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හෝමාගම | - | - | - |
| 2. | ජී.ටී.ඩී. කුමාරි මිය සංවර්ධන නිලධාරී | 2017.07.13 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මාවනැල්ල | - | - | - |
| 3. | එම්. සංජීවනී මිය සංවර්ධන නිලධාරී | - | - | - | 2017.03.08 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය බලපිටිය |
| 4. | ඒ.කේ. පුෂ්පා රංජනී මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.05.17 | දේශීය අදායම් දෙපාර්තමේන්තුව | - | - | - |
| 5. | එම්.ජී.ඩී.එම්.ඩී.මැටිම් පොතගෙදර මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.08.21 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගලේවෙල | - | - | - |
| 6. | එන්.සී.යු.ලියනගේ මෙය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.01.30 | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | - | - | - |
| 7. | ජේ.සුනිල් මයා රියදුරු | 2017.07.13 | වනජීවී දෙපාර්තමේන්තුව | එච්. එච්.එස්. කුමාර මයා | 2017.07.10 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 8. | ඩබ්.එම්.එස්.බී. වීරසූරිය මයා රියදුරු | - | - | - | 2017.07.10 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 9. | බී.සී.පෙරේරා මයා රියදුරු | 2017.04.03 | මුදල් අමාත්‍යාංශය | - | - | - |
| 10. | බී.එච්.ජේ. පීරිස් මයා රියදුරු | - | - | - | 2017.08.03 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| 11. | ටී.විමලන් මයා ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | 2017.05.31 | සහකාර අධ්‍යක්ෂ තනතුරක් ලැබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවෙන් මුදා හැර ඇත. | | | |
| 12. | ටී. චන්ද්‍රපාල මයා සංවර්ධන නිලධාරී | 2017.07.12 | ගුරු සේවයේ පත්වීම් ලැබීම හේතුවෙන් මෙම දෙපාර්තමේන්තුවෙන් මුදා හැර ඇත | | | |
| 13. | එම්.එච්.ඩබ්. ප්‍රියදර්ශනී මෙය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.09.06 | | | | |
| 14. | කේ.ජේ.කේ. චතුරි මිය රාජ්‍ය කළමනාකරණ සහකාර | 2017.03.20 | | | | |

## 3.3.ආයතනික කටයුතු

| අනු අංකය | විස්තර | පෙර වසර (2016) | | | ප්‍රවර්තන වසර (2017) | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | අනුමත කල සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව | සංඛ්‍යාව | අනුමත කළ සංඛ්‍යාව | ඉතිරි සංඛ්‍යාව |
| 01 | සේවයට බඳවා ගැනීම | 11 | - | - | | - | - |
| 02 | විභාග පැවැත්වීම | 09 | - | - | - | - | - |
| 03 | සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම | 02 | - | - | 01 | 01 | - |
| 04 | සේවය ස්ථිර කිරීම | 02 | - | - | 05 | 05 | - |
| 05 | උසස් කිරීම | 126 | - | - | 08 | 08 | - |
| 06 | වැටුප් වර්ධක ගෙවීම | සියළුම | සියළුම | - | සියළුම | සියළුම | - |
| 07 | සේවය දීර්ඝ කිරීම | - | - | - | - | - | - |
| 08 | බඳවා ගැනීම් පටිපාටි සැකසීම | 05 | - | - | - | - | - |
| 09 | සේවය හැර යාම | 01 | - | - | 01 | - | - |
| 10 | වැඩ තහනම් කිරීම | - | - | - | - | - | - |
| 11 | නැවත සේවයේ පිහිටුවීම | - | - | - | - | - | - |
| 12 | විනය පරීක්ෂණය | - | - | - | 01 | 01 | - |
| 13 | විදේශ නිවාඩු අනුමත කිරීම | 03 | - | - | 07 | 07 | - |
| 14 | විදේශ ශිෂ්‍යත්ව | - | - | - | - | - | - |
| 15 | අමාත්‍ය මණ්ඩල සංදේශ | - | - | - | - | - | - |
| 16 | ඇප ආරම්භ කිරීම | - | - | - | - | - | - |
| 17 | ඇප නිදහස් කිරීම | - | - | - | - | - | - |
| 18 | ණය අනුමත කිරීම | 127 | 127 | - | - | - | - |
| 19 | දේපළ | 05 | 05 | - | 05 | 05 | - |
| 20 | වාහන | - | - | - | - | - | - |
| 21 | වෙනත් - ආපදා | 122 | 122 | - | 90 | 90 | - |
| 22 | මුදා හැරීම් | 07 | 07 | - | 06 | 06 | - |

## 3.4.මානව සම්පත් සංවර්ධනය

**විදේශීය පුහුණු -2017 වර්ෂය**

| අනු අංකය | පාඨමාලාව | නිලධාරියාගේ නම | තනතුර | විදේශ පුහුණුව ලැබූ රට | කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01. | දත්ත පද්ධති කළමනාකරණ සහ අන්තර්ජාල වැඩසටහන් සකස් කිරීම, උසස් සන්නිවේදන තාක්ෂණ | ව්.එල්.ඒ. හිරන්ති මිය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි | ඉන්දියාව | මාස 02 |
| 02 | හැකියාවන් වර්ධනය කිරීමේ පුහුණු වැඩ සටහන (කොළඹ, ත්‍රිකුණාමලය ආර්ථික කලාපය) | බී.ඒ. ජයනන්ද මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) | කොරියාව | දින 05 |
| 03 | ග්‍රාමීය සංවර්ධනය සඳහා භූ විද්‍යා දත්ත යොදා ගැනීම | චන්දිමා නිලන්ති මිය | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉන්දියාව | මාස 02 |
| 04 | GIS Remote Sensing | බාලමුරලිදරන් මයා | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරී | ඉන්දියාව | සති 07 |

**දේශීය පුහුණු**

| අනු අංකය | පාඨමාලාව | නිලධාන් සංඛ්‍යාව | තනතුර | ආයතනය | පැවැත්වූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| 01 | පශ්චාත් උපාධි පාඨමාලාව | 09 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ විද්‍යා) ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් | කැලණිය විශ්ව විද්‍යාලය | වසර 01 |
| 02 | භූ විද්‍යා දත්ත සලකුණු කිරීම | 25 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | දින 01 |
| 03 | දැනුම් කලමනාකරණය | 05 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | දින 01 |
| 04 | පරිගණනය හා රජයේ වැටුප් ගෙවීමේ ක්‍රමවේදය | 01 | කලමනාකරණ සහකාර | මිලෝදා ආයතනය | දින 03 |
| 05 | ඉඩම් පරිහරණ සැලසුම්කරණය සහ පාංශු වර්ගීකරණය සඳහා ප්‍රායෝගික හා න්‍යායාත්මක පුහුණු පාඨමාලාව | 15 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | දින 02 |
| 06 | කාර්යාලීය උපකරණ භාවිතය | 02 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | නිපුණතා සංවර්ධන ආයතනය | දින 02 |
| 07 | ඵලදායිතා හැකියාව, ආකල්ප පිළිබඳ දැනුම | 60 | නියෝජ්‍ය අධ්‍යක්ෂ සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින්, රාජ්‍ය කළමානකාර සහකාර නිලධාරින්, කා.සේ.සේ | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | දින 01 |
| 08 | භූමි නිර්මාණය පිළිබඳ දැනුවත් කිරීම | 20 | සහකාර අධ්‍යක්ෂ ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගලෙන්බිඳුනුවැව | දින 02 |
| 09 | පාංශු විශ්ලේෂණය හා භූමි ඇගයීම පිළිබඳ පුහුණු වැඩසටහන | 30 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලය - ගම්පහ | දින 02 |
| 10 | කළමනාකරණ සහකාර නිලධාරින්ගේ හැකියාවන් වර්ධනය කිරීම | 8 | කළමනාකරණ සහකාර නිලධාරින් | නිපුණතා සංවර්ධන ආයතනය | දින 03 |
| 11 | ප්‍රසම්පාදන ලේඛන සැකසීම | 01 | සංවර්ධන නිලධාරින් | මිලෝදා ආයතනය | දින 02 |
| 12 | භූ දත්ත පද්ධති පිලියෙළ කිරීම | 25 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් | දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කාර්යාලය - ගම්පහ | දින 03 |
| 13 | ඉඩම් යෝග්‍යතාවය හා භෝග විද්‍යාව | 60 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන් හා සංවර්ධන නිලධාරින් | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | දින 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 14 | භූමි පද්ධති විද්‍යාව සඳහා භූමි තොරතුරු | 04 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින්, සංවර්ධන නිලධාරීන් | ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය | දින 05 |
| 15 | Advanced M.S. Excel | 01 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් | මිලෝදා ආයතනය | දින 02 |
| 16 | Formal Letter Writing Skills | 02 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් | මිලෝදා ආයතනය | දින 02 |
| 17 | Integrated Farm Management | 20 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින්, සංවර්ධන නිලධාරීන් බදුල්ල | Bee Keeping Development Center - බණ්ඩාරවෙල | දින 01 |
| 18 | GIS & Application | 25 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් | PGIS, පේරාදෙණිය විශ්ව විද්‍යාලය | දින 06 |
| 19 | Scheme of Recruitment | 02 | කළමනාකරණ සහකාර | නිපුණතා සංවර්ධන ආයතනය | දින 02 |
| 20 | ජාතික අවකාශීය දත්ත අධෝව්‍යුහ සඳහා භූගෝල විද්‍යා තොරතුරු පද්ධති දත්ත රැස් කිරීම පිළිබඳ පුහුණුව | 40 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් හා සංවර්ධන නිලධාරීන් | ICTA ආයතනය නාරාහේන්පිට | දින 02 |
| 21 | ඉඩම් යෝග්‍යතාවය හා බෝග විද්‍යාව | 53 | ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරීන්, සංවර්ධන නිලධාරීන් කුරුණෑගල | වයඹ පුහුණු ආයතනය | දින 01 |
| 22 | පාංශු සහ ජල සංරක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන | 26 | සහකාර අධ්‍යක්ෂ (දි.ඉ.ප.) ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරින් හා සංවර්ධන නිලධාරීන් | පුහුණු ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගන්නොරුව පේරාදෙණිය | දින 04 |
| 23 | පාංශු සහ ජල සංරක්ෂණ පිළිබඳ පුහුණු වැඩසටහන | 350 | ඉඩම් පරිහරණ සැලසුම් හා සංවර්ධන නිලධාරීන් | දිස්ත්‍රික් කාර්යාලය | දින 01 |

# 04.මූල්‍ය කළමනාකරණය- 2017

## 4.1.වැය ඇස්තමේන්තු

ඇමුණුම 04

| | පෙර වර්ෂය (2016) | | | වියදමේ ප්‍රතිශතය (%) | ප්‍රවර්තන වර්ෂය (2017) | | | වියදමේ ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | | ප්‍රතිපාදන | වියදම | ඉතිරිය | |
| ව්‍යාපෘති 2 | | | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 300,565,000 | 299,934,674 | 630,326 | 99.79 | 303,870,000 | 301,965,592 | 1,904,408 | 99.37 |
| වෙනත් පුනරාවර්තන | 48,500,000 | 45,381,142 | 3,118,858 | 93..57 | 47,100,000 | 44,552,893 | 2,547,107 | 94.59 |
| ප්‍රාග්ධන | - | - | - | - | - | - | - | - |
| 2001 | 28,862,000 | 24,221,911 | 4,640,089 | 83..92 | 8,000,000 | 7,562,197 | 437,803 | 94.53 |
| 2002 | 1,900,000 | 1,862,971 | 37,029 | 98..05 | 2,000,000 | 649,773 | 1,350,227 | 32.49 |
| 2003 | 4,350,000 | 3,557,098 | 792,902 | 81..77 | 4,000,000 | 3,643,074 | 356,926 | 91.08 |
| 2102 | 2,500,000 | 2,180,223 | 319,777 | 87.21 | 2,500,000 | 2,361,244 | 138,756 | 94.45 |
| 2103 | 2,000,000 | 1,947,886 | 52,114 | 97.39 | 2,050,000 | 2,049,799 | 201 | 99.99 |
| 2104 | - | - | - | - | 12,000,000 | 10,450,295 | 1,549,705 | 87.09 |
| 2105 | 28,400,000 | 27,891,979 | 508,021 | 98.21 | - | - | - | - |
| 2401 | 2,000,000 | 1,971,004 | 28,996 | 98.55 | 3,000,000 | 2,847,587 | 152,414 | 94.92 |
| 2507 | - | - | - | - | 20,000,000 | 19,472,549 | 527,451 | 97.36 |
| එකතුව | **419,077,000** | **408,948,888** | **10,128,112** | - | **404,520,000** | **395,555,002** | **8,964,998** | - |

## 4.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

ඇමුණුම 05

| සීමාවන් | පෙර වර්ෂය (2016) | | ප්‍රවර්තන වර්ෂය (2017) | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය |
| වියදමේ උපරිම සීමාව | 21,000,000.00 | 20,906,777.91 | 22,000,000.00 | 21,858,175.94 |
| අවම බැර සීමාව | 11,000,000.00 | 17,107,683.00 | 14,500,000.00 | 17,995,716.20 |
| උපරිම හර ශේෂ සීමාව | 67,000,000.00 | 58,948,321.48 | 69,000,000.00 | 62,810,781.22 |

## 4.3 ආදායම් ගිණුම

20-02-02-99

ඇමුණුම 06

| | පෙර වර්ෂය (2016) | ප්‍රවර්තන වර්ෂය (2017) |
|---|---|---|
| ඇස්තමේන්තුව | 2,200,000.00 | 2,400,000.00 |
| වර්ෂයේ අදායම | 2,366,189.75 | 2,523,976.67 |
| වෙනස (+/-) | 166,189.75 | 123,976.67 |

20-03-99-00

| | පෙර වර්ෂය (2016) | ප්‍රවර්තන වර්ෂය (2017) |
|---|---|---|
| ඇස්තමේන්තුව | 400,000.00 | 400,000.00 |
| වර්ෂයේ අදායම | 500,023.60 | 528,726.04 |
| වෙනස (+/-) | 100,023.60 | 128,726.04 |

20-02-01-01

| | පෙර වර්ෂය (2016) | ප්‍රවර්තන වර්ෂය (2017) |
|---|---|---|
| ඇස්තමේන්තුව | - | 55,000.00 |
| වර්ෂයේ අදායම | - | 108,652.55 |
| වෙනස (+/-) | - | 53,652.55 |

# 4.4.භෞතික සම්පත් කළමනාකරණය - 2017

## චංචල දේපළ

| අනු අංකය | වත්කම් වර්ගය | වසර ආරම්භයේ පැවති තත්ත්වය | 2017-වර්ෂය තුළ සිදු වන වෙනස් වීම් | | | | වසර අවසානයේ පැවති තත්ත්වය |
|---|---|---|---|---|---|---|---|
| | | | අත්පත් කර ගැනීම | මිල දී ගැනීම | වෙන්දේසි කිරීම | ඉවත් කිරීම | |
| 01 | කැබ් රථ | 20 | 2 | - | - | - | 22 |
| 02 | වෑන් | 04 | - | - | - | - | 04 |
| 03 | මෝටර් රථ (ජීප්/කාර්) | 13 | 01 | - | - | 01 | 13 |
| 04 | මල්ටිමීඩියා ස්ක්‍රීන් | 08 | - | - | - | - | 08 |
| 05 | Projectors | 07 | - | - | 03 | - | 04 |
| 06 | Multi Media Projector | 15 | - | - | - | - | 15 |
| 07 | යකඩ අල්මාරි | 31 | - | 10 | 03 | - | 38 |
| 08 | කැබිනට් | 78 | - | 3 | 5 | 1 | 75 |
| 09 | පුටු සමන්ත්‍රණ ශාලාව | 22 | - | - | 10 | - | 12 |
| 10 | ප්ලාස්ටික් පුටු | 01 | - | - | - | - | 01 |
| 11 | පුටු | 177 | - | 86 | 08 | 09 | 246 |
| 12 | පරිගණක පුටු | 41 | - | 12 | 09 | 02 | 42 |
| 13 | Clark Chairs | 15 | - | - | | - | 15 |
| 14 | Cushion Chairs | 04 | - | - | - | - | 04 |
| 15 | Visitor Chairs | 30 | - | 06 | - | - | 36 |
| 16 | Steel Chairs | 91 | - | - | 09 | 06 | 76 |
| 17 | Executive Chairs | 32 | - | 04 | 02 | 01 | 33 |
| 18 | Drawing Tables | 03 | - | - | - | - | 03 |
| 19 | Table | 246 | - | 56 | 01 | 01 | 300 |
| 20 | Executive Tables | 0 | | 03 | - | - | 03 |
| 21 | Computer Tables | 16 | - | 08 | 03 | - | 21 |
| 22 | Photocopy Machine | 20 | - | 03 | - | - | 23 |
| 23 | Printer (B&W) | 02 | - | 04 | - | - | 06 |
| 24 | පරිගණක ප්‍රින්ටර්ස් (වර්ණ) | 07 | - | 03 | - | - | 10 |
| 25 | කබඩ් | 49 | - | -- | - | - | 49 |
| 26 | Printers | 42 | - | 01 | 05 | 02 | 36 |
| 27 | Rubber Seal | 01 | - | - | - | - | 01 |
| 28 | Bunk Bed Mattress | 14 | - | 35 | 02 | 01 | 46 |
| 29 | Calculators | 134 | - | - | 03 | 17 | 114 |
| 30 | Fax Machine | 30 | - | 04 | 01 | 06 | 27 |
| 31 | Router | 01 | - | - | - | - | 01 |
| 32 | File Rack | 30 | - | - | 02 | 01 | 27 |
| 33 | Photo Copy Scanner Stand | 01 | - | 01 | - | - | 02 |
| 34 | Racks for Library | 01 | - | - | - | - | 01 |
| 35 | Battery | 08 | - | - | -- | - | 08 |
| 36 | Staplers | 240 | - | - | 04 | 02 | 234 |
| 37 | Safe | 01 | - | - | - | - | 01 |
| 38 | Binding Machine | 01 | - | - | - | | 01 |
| 39 | Punchers | 255 | - | - | 07 | 02 | 246 |
| 40 | Monitor | 103 | - | 10 | 06 | 03 | 104 |
| 41 | Hard Disk | 03 | - | 02 | 02 | - | 03 |
| 42 | Key Board | 188 | - | 15 | - | - | 203 |
| 43 | Computers | 09 | - | 06 | - | - | 15 |
| 44 | Mouse | 190 | - | 25 | - | - | 215 |
| 45 | UPS | 123 | - | 25 | 15 | 09 | 124 |
| 46 | CPU | 102 | - | - | 11 | 01 | 90 |
| 47 | Laptop | 49 | - | 03 | 02 | - | 50 |
| 48 | Scanner | 28 | - | - | - | - | 28 |
| 49 | GPS Trimble | 08 | - | - | - | - | 08 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 50 | GPS | 23 | - | - | 04 | 03 | 16 |
| 51 | Clino Meter | 01 | - | - | - | - | 01 |
| 52 | EC Meter | 12 | - | - | - | 01 | 11 |
| 53 | PH Meter | 22 | | - | - | 02 | 20 |
| 54 | Color Chart | 20 | - | - | - | - | 20 |
| 55 | Soil Augar | 20 | - | - | - | - | 20 |
| 56 | Compass | 50 | - | - | - | 01 | 49 |
| 57 | Extension Code | 02 | - | - | - | - | 02 |
| 58 | Table Fan | 02 | - | - | - | - | 02 |
| 59 | Fan Regulator | 07 | - | - | 02 | 04 | 01 |
| 60 | Wall Fan | 10 | - | - | 03 | - | 07 |
| 61 | Stand Fan | 08 | - | 05 | - | - | 13 |
| 62 | Tube Light | 01 | - | - | - | - | 01 |
| 63 | Filter | 04 | - | - | - | - | 04 |
| 64 | Iron | 01 | - | - | - | - | 01 |
| 65 | Refrigerator | 01 | - | - | - | - | 01 |
| 66 | Gas Cooker | 01 | - | - | - | - | 01 |
| 67 | Rice Cooker | 01 | - | - | - | - | 01 |
| 68 | Coconut Greater | 01 | - | - | - | - | 01 |
| 69 | Electric Kettle | 15 | - | 03 | 01 | 01 | 16 |
| 70 | Ac Machine | 16 | - | - | 02 | - | 14 |
| 71 | Digital Camera | 47 | - | - | 08 | 02 | 37 |
| 72 | Glass Pad | 07 | - | - | - | 07 | - |
| 73 | Tab | - | - | 01 | - | - | 01 |
| 74 | Television | 01 | - | 01 | - | - | 02 |
| 75 | White Board | - | - | 01 | - | - | 01 |
| 76 | Cash Box | - | - | 01 | - | - | 01 |
| 77 | Mobile Drawer Box | - | - | 01 | - | - | 01 |

## 4.5. ගබඩා සමීක්ෂණ

2017 වර්ෂය සඳහා සියළු භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

## 4.6. විගණන කටයුතු

යොමුකර ඇති සියළු විගණන වාර්තා සඳහා පිළිතුරු සපයා ඇත.

# 05.සංවර්ධන කටයුතු

## 5.1.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත. යම්කිසි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක පවත්නා ඉඩම් පරිහරණ රටාව සහ ඉඩම් පරිහරණ ගැටළු හඳුනාගෙන, ඊට හේතු පාදක වන සාධක විශ්ලේෂණය කර, එම ගැටළු අවම කිරීමට අවශ්‍ය උපාය මාර්ගික යෝජනා ඉදිරිපත් කිරීම ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මක් මඟින් සිදුකෙරේ. එමගින් මෙරට භූමි සම්පත තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම ලබාදීම සිදුකරනු ලබයි. එමෙන්ම පවත්නා පරිහරණයේ සිදු කළ යුතු වැඩිදියුණු කිරීම් සඳහා සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහාත් මෙම සැලසුම් බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

මෙහිදී ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ විවිධ ආයතන හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධවී තාක්ෂණික මඟ පෙන්වීම අප ආයතනය මගින් සිදු කරයි.

අවසන් කරන ලද ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා 286ක් ප්‍රධාන කාර්යාලයට ලැබී ඇත. අදාළ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තාවලින් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ව්‍යාපෘති 50 ක් සඳහා ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර, 2017.12.31 දිනට එහි භෞතික ප්‍රගතිය 100% ක් වේ.

**<u>2017 වර්ෂයේ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන ඡායාරූප</u>**

**මහනුවර දිස්ත්‍රික්කය හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**පෙර පැවති තත්වය**



**කුඹුරු සකස් කර ඇති ආකාරය**



**මාතර දිස්ත්‍රික්කය - පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**



**මාතර දිස්ත්‍රික්කය - මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**



## 5.2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් හා මඟ පෙන්වීම යටතේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව ක්‍රියාත්මක කරනු ලබන අතර, දිස්ත්‍රික් කාර්යාල හරහා මෙහි සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.

මෙම කමිටුවල කාලීන වැදගත්කම අනුව සෑම දිස්ත්‍රික්කයකම ක්‍රියාත්මක වේ. දිස්ත්‍රික් ලේකම්වරයා මෙම කමිටුවේ සභාපති ලෙස කටයුතු කරන අතර සහකාර අධ්‍යක්‍ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරනු ඇත. මෙම කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විය යුතු අතර විශේෂ හා හදිසි රැස්වීම් කැඳවීමට දිසාපති/දිස්ත්‍රික් ලේකම්ට හැකිය.

කමිටුවට ඉදිරිපත් වන කරුණක් පිළිබඳව තීරණයක් ගැනීම සඳහා විස්තරාත්මක අධ්‍යයනයක් කළයුතු යැයි හැඟෙන අවස්ථාවලදී ඒ සඳහා කමිටු සාමාජිකයන් කිහිප දෙනෙකුගෙන් සමන්විත අනුකමිටුවක් පත්කල හැකි අතර, අවශ්‍ය පරිදි ඒ ඒ විෂයයන් සඳහා විශේෂඥයන් ද අනුකමිටුවට පත්කළ හැකිය.

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුව මඟින් දිස්ත්‍රික්කයේ ඉඩම් භාවිතය විධිමත් කිරීම සඳහා සකස් කරනු ලබන ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා සමාලෝචනය කරනු ලබන අතර විවිධ සංවර්ධන කාර්යයන් සඳහා රජයේ ඉඩම් නිදහස් කිරීමේදී මෙම නිර්දේශ සලකා බලනු ලැබේ.

එමෙන්ම දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහභාගිත්වයෙන් මෙම කමිටුව පැවැත්වෙන නිසාත්, ඉඩම් බෙදා දීම සම්බන්ධයෙන් සියලුම පාර්ශවකරුවන් සහභාගීවන නිසාත්, රජයේ ඉඩම් ඵලදායි ලෙසත් විද්‍යාත්මක ලෙසත් භාවිතයට පත් කිරීමට හැකිවෙනවා පමණක් නොව සංරක්ෂණය හා ආරක්ෂා කළයුතු ප්‍රදේශ ආරක්ෂා කිරීමටද මෙම කමිටුව බෙහෙවින් පිටුවහල් වේ.

**කමිටුවේ කාර්ය භාරය :-**

01. දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රයෝජනයට ගත හැකි දැනට හිස්ව පවතින ඉඩම් පිළිබඳ තොරතුරු සොයා බැලීම හා වාර්තා කිරීම.
02. ඉඩම් පරිහරණ ක්ෂේත්‍රය තුළ යෝජිත සංවර්ධන වැඩසටහන්වලට අනුව ප්‍රමුඛතාවය දිය යුතු අංශ නිශ්චය කිරීම.
03. නාගරික සහ ග්‍රාමීය අංශයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
04. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාවට නැගෙන විවිධ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම සහ නිදහස් කිරීම

ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතරව පහත සඳහන් කරුණුද දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ කාර්යභාරයට අයත් වේ.

01. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු සම්බන්ධව ජාතික මට්ටමේ කමිටුවට පූර්ව දැනුම් දීමට අදාළ කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය වැඩිදියුණු කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය සඳහා මඟ පෙන්වීම.
03. දිස්ත්‍රික්කය තුළ පවතින ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු සඳහා අවශ්‍ය වන තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

04. දිස්ත්‍රික්කය සඳහා සකස් කර ඇති ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ භූමි පරිහරණය සම්බන්ධ පසු විපරම් කටයුතු කිරීම.
05. දිස්ත්‍රික්කය තුළ ඉඩම් පරිහරණයට සම්බන්ධ ආයතන අතර සම්බන්ධීකරණයක් ඇති කිරීම.
06. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලැස්මේ නිර්දේශ, සාකච්ඡාකර අනුමත කිරීම.

## 2017 වර්ෂයේ පවත්වනු ලැබූ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු අවස්ථාවන්

කිලිනොච්චි දිස්ත්‍රික්කය



මාතලේ දිස්ත්‍රික්කය



මඩකලපුව දිස්ත්‍රික්කය



මන්නාරම දිස්ත්‍රික්කය



**දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ සංයුතිය:-**

01. දිස්ත්‍රික් ලේකම් (සභාපති )
02. ප්‍රාදේශීය ලේකම්වරු
03. සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ලේකම්
04. පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්
05. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (ව්‍යාප්ති)
06. දිසා වන නිලධාරි
07. මිනින්දෝරු අධිකාරී
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්
09. නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ
10. පළාත් පාලන සහකාර කොමසාරිස්
11. සහකාර අධ්‍යක්ෂ, අපනයන බෝග
12. කළමනාකරු, කුඩාතේ වතු සංවර්ධන අධිකාරිය
13. නියෝජ්‍ය අධ්‍යක්ෂ, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
14. ප්‍රාදේශීය කළමනාකරු, පොල් වගා කිරීමේ මණ්ඩලය
15. සහකාර අධ්‍යක්ෂ ,මධ්‍යම පරිසර අධිකාරිය

මීට අමතරව අවශ්‍ය අවස්ථාවල දී දිස්ත්‍රික් ලේකම්ගේ අභිමතය පරිදි වෙනත් දෙපාර්තමේන්තු/ආයතන සඳහා සාමාජිකත්වය ලබා දිය හැකිය.

මේ අනුව 2017 වර්ෂයේ දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු 100ක් පැවැත්වීමට සැලසුම් කළ අතර කමිටු 78ක් පවත්වා ඇත. එක් කමිටුවක් සඳහා වෙන් කරන ලද මුදල රු.3000/= කි.

## 5.3.ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවේ උපදෙස් හා මග පෙන්වීම් මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් මෙම කමිටුව ක්‍රියාත්මක වේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ ඉඩම් පරිහරණ සැලසුම් වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මෙම කමිටුවේ සම්බන්ධීකරණය මත සිදුවේ. ප්‍රාදේශීය ලේකම්වරයා සභාපතිත්වය දරණ මෙම කමිටුවේ ලේකම්වරයා ලෙස ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරියා කටයුතු කරනු ඇත.

**කමිටුවේ කාර්යභාරය :-**

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.
02. ඉඩම් පරිහරණය සම්බන්ධව ප්‍රමුඛතාවය දිය යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.
03. කොට්ඨාශ තුළ පවතින ඉඩම් පරිහරණ ගැටළු හඳුනා ගැනීම, ඒවාට විසඳුම් ලබාදීම සහ අවශ්‍ය අවස්ථා වලදී දිස්ත්‍රික් කමිටුව වෙත වාර්තා කිරීම.
04. ඉඩම් පරිහරණ සැලසුම් යෝජනා මත පදනම් වූ දිගුකාලින හා කෙටිකාලින යෝජනා සඳහා ක්‍රියාත්මක වැඩපිළිවෙළක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කළයුතු කාර්යයන් ප්‍රමුඛතාවය අනුව පෙළගැස්වීම. මෙය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වාර්ෂික සැලැස්මට ඇතුළත් කරගත යුතුය.

05. ජාතික/දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුවලට ඉඩම් පරිහරණ කාර්යයන් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීම.
06. ඉඩම් බෙදා දීම හා වෙන්කරදීම, ඉඩම් කච්චේරි පැවැත්වීම සඳහා ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටුව මගින් අවශ්‍ය නිර්දේශ ලබාදීම.
07. රජයේ කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම කමිටුවේ නිර්දේශය මත සිදුවේ.
08. ග්‍රාමීය මට්ටමෙන් ක්‍රියාත්මක වන ඉඩම් පරිහරණ සැලසුම් කමිටු සඳහා අවශ්‍ය උපදෙස් හා මග පෙන්වීම.
09. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම.
10. විවිධ කටයුතු සඳහා ඉඩම් වෙන් කිරීමේදී යෝග්‍යතාවය පදනම් කරගෙන අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම්.
11. ප්‍රාදේශීය මට්ටමෙන් ඉඩම් පරිහරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීම හා දිස්ත්‍රික් දත්ත පද්ධතිය හා ඒකාබද්ධ කිරීම.

**කමිටුවේ සංයුතිය :-**

01. ප්‍රාදේශීය ලේකම් (සභාපති)
02. ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි (ලේකම්)
03. ඉඩම් නිලධාරි/ජනපද නිලධාරි
04. කෘෂිකර්ම උපදේශක
05. ගොවිජන සංවර්ධන නිලධාරි
06. අඩවි වන නිලධාරි
07. සහකාර මිනින්දෝරු අධිකාරි
08. පොල්/තේ/රබර්/බහු වාර්ෂික බෝග සඳහා වූ ව්‍යාප්ත නිලධාරීන්
09. සත්ව සංවර්ධන උපදේශක
10. පරිසර නිලධාරි
11. වැවිලි සහ වතු වගා අංශයේ අදාළ නියෝජිතයින්
12. ගොවි සංවිධානයේ නියෝජිතයෙක්
13. ඉඩම් පරිහරණ සැලසුම් කටයුතුවලට අදාළ රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින්

2017 වර්ෂයේ දී ප්‍රාදේශීය කමිටු 300ක් පැවැත්වීමට ඉලක්කකළ අතර එම කමිටු 300 ම පවත්වා ඇත. ඇතැම් ප්‍රා දේශීය ලේකම් කොට්ඨාශවල, ප්‍රාදේශීය කෘෂිකාර්මික කමිටුව එයට සමගාමීව පවත්වා අදාළ ඉලක්කය ලඟාකර ගත්තද මුදල් වැය වීමක් සිදු වී නොමැත. මෙම එක් කමිටුවක් පැවැත්වීම සඳහා රු.1250 /= ක මුදලක් වෙන් කර ඇත.

**2017 වර්ෂයේ පවත්වනු ලැබූ ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටු අවස්ථාවන්**

**දිස්ත්‍රික්කය - මන්නාරම**
**මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**



**දිස්ත්‍රික්කය - කිලිනොච්චිය**
**කණ්ඩාවලෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**



## 5.4. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය

ශ්‍රී ලංකාවේ භූමි භාවිතය පිළිබඳ විවිධ කාල වකවානුවල සකස්කල ඉඩම් පරිහරණ දත්ත ඇතත් යාවත්කාලීන කළ තොරතුරුවල හිඟය සැලසුම් සකස් කිරීමේ දී මූලික අඩුපාඩුවක්ව පවතී. එම අඩුපාඩුව සම්පූර්ණ කිරීම සඳහා පොදු මූලධර්ම අනුව සකස්කල මාර්ගෝපදේශයක් ඔස්සේ සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්යයක් ලෙස ආරම්භ කෙරුණි. විවිධ ආයතන සහ දෙපාර්තමේන්තු මෙන්ම දිස්ත්‍රික් ලේකම් වරුන් හා ප්‍රදේශිය ලේකම්වරුන් හට ඉඩම් භාවිතය පිළිබඳ නව දත්ත නොමැති වීම විශාල ගැටළුවක් වන නිසා එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමටත් මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් පරිහරණ සැලසුම් කටයුතු වඩාත් ක්‍රමවත් කිරීමටත් මෙම වැඩසටහන බෙහෙවින්ම ඉවහල් වේයැයි අපේක්ෂා කරනු ලැබේ.

මෙම සමීක්ෂණය වර්ෂ 5කට වරක් සිදු කිරීම සඳහා දැනට යෝජනා කර ඇත. 2017 වර්ෂයේදී 1:10,000 පරිමාණ සිතියම් 1831 ක් මඟින් සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ඉඩම් පරිහරණ සිතියම් යාවත්කාලීන කිරීම අරමුණු කර තිබූ අතර 2017.12.31 දිනට සිතියම් 1831ක් යාවත්කාලීන කිරීමේ ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කර ඇත.

## 5.5. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන ක්‍රියාත්මක කිරීම

මෙම වැඩසටහනේ මූලික අරමුණ වනුයේ ඉඩම් පරිහරණ ගැටළු බහුල වශයෙන් පවතින ගමක හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශයක නිශ්චිත පවුල් සංඛ්‍යාවක් තෝරාගෙන ඔවුන්ගේ ඉඩම් විද්‍යාත්මක පරිහරණය සඳහා යොමු කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම සිදු කිරීමයි. විශේෂයෙන් ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් කමිටුවක් ගම තුළ ස්ථාපිත කර ඉඩම් පරිහරණය හා සම්බන්ධ ගැටළු ඉඩම් ලාභීන්ගෙන්ම හඳුනාගැනීම සිදුවේ. එම ගැටළු විසඳා ගැනීම සඳහා අදාළ දායක ආයතන සම්බන්ධ කර ගනිමින් එම ගැටළු අවම කර තම ඉඩමේ උපරිම වටිනාකම ප්‍රතිලාභීන්ට ලබා ගත හැකි වන සේ වැඩසටහන් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වේ. මේ තුළින් පාංශු සංරක්ෂණය, කාබනික පොහොර භාවිතය, දිරි ගැන්වීම තුළින් ඉඩමේ භෞතික ගුණාංග නඟා සිටුවන අතර, ආර්ථික බෝග හා දෛනික අවශ්‍යතාවන්ට ගැලපෙන බෝග විවිධාංගිකරණය වේ. මෙමඟින් ග්‍රාමීය ඉඩම් ලාභීන්ගේ ආර්ථික ශක්තිය ගොඩ නැංවෙන අතර, පෝෂණ මට්ටම වැඩිදියුණු වීමද සිදු වේ. ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුමක් තුළින් පුද්ගල සංවර්ධනය මෙන්ම දිගු කාලීන භූමි සම්පතේ තිරසාර බවද තහවුරු වනු ඇත.

උචිත ඉඩම් පරිහරණ සැලසුමට අදාළ ව්‍යාපෘති වාර්තාව සකස්කර ප්‍රාදේශීය මට්ටමෙන් සේවයේ යෙදී සිටින නිලධාරීන් දිස්ත්‍රික් කාර්යාල හරහා ප්‍රධාන කාර්යාලයට අදාළ ව්‍යාපෘති වාර්තා අනුමැතියට

යොමු කරයි. එයට අදාළ අනුමැතිය ලැබීමෙන් පසුව සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික් ඉඩම් පරිහරණ) ගේ අධීක්ෂණ මත මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. 2017 වර්ෂයේ ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන 300ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කළ අතර 2017.12.31 වන විට ආදර්ශන 300 ම සාර්ථකව නිම කර ඇත. එක් වැඩසටහනක් සඳහා රු.50,000.00 ක මුදලක් වෙන් කරන ලදී.

**<u>2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් ආදර්ශන</u>**

**අම්පාර දිස්ත්‍රික්කය -දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**දැනුවත් කිරීමේ අවස්ථාවක්**





**කළුතර දිස්ත්‍රික්කය - දොඩංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**කළුතර දිස්ත්‍රික්කය - බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - දැනුවත් කිරීමේ අවස්ථාවක්**





## 5.6. පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

ඵලදායි ලෙස ඉඩම් භාවිතා කිරීම පිළිබඳව පාසල් ළමුන් දැනුවත් කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණ වේ. රටේ අනාගත පරපුර මෙන්ම ගම තුළට ඉක්මනින් පණිවිඩ ගෙන යා හැකි ප්‍රධාන මාධ්‍ය වන පාසල් සිසුන් තිරසර සහ ප්‍රශස්ත භූමි පරිහරණ සැලසුම් කිරීම සම්බන්ධ දැනුවත් කිරීම වර්තමාන මෙන්ම අනාගත ආයෝජනයක්ද වේ. අ.පො.ස.උසස් පෙළ භූගෝල විද්‍යා විෂය ධාරාවට ඉඩම් පරිහරණ සැලසුම් විෂයද ඇතුළත් කර ඇති බැවින් මෙම වැඩසටහන් පැවැත්වීම කාලිනව වැදගත් වී ඇත. එමෙන්ම ප්‍රජාව දැනුවත් කිරීම තුළින් ඔවුන් තුළ පවතින වැරදි ඉඩම් භාවිතයන් අවම කිරීමටත්, මෙතෙක් භාවිතයට ගෙන නොමැති ඉඩම් භාවිතයට යොමු කිරීමත්, ඌන භාවිතා ඉඩම් ප්‍රශස්ථ භාවිතයට යොමු කිරීම, පස, වනාන්තර සහ ජලය ආරක්ෂා කිරීමට අවශ්‍ය ජනතාවගේ ආකල්ප වර්ධනය කිරීමට මෙමගින් හැකි වේ. ඒ තුළින් භූමිය තිරසර බවට පත් කිරීම අරමුණ වේ.

2017 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් 300ක් පැවැත්වීමට ඉලක්ක කළ අතර එම වැඩසටහන් 300ම සාර්ථකව පවත්වා ඇත. එක් වැඩසටහනක් වෙනුවෙන් රු.3000/= ක මුදලක් වෙන් කරන ලදී.

**<u>2017 වර්ෂයේ පවත්වන ලද පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන්</u>**

**මාතලේ දිස්ත්‍රික්කය - ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**<u>නිලධාරීන්</u>**



**මාතලේ දිස්ත්‍රික්කය - නා උල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

**<u>ප්‍රජාව</u>**



**බදුල්ල දිස්ත්‍රික්කය - කන්කැටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - ඩී.එස්. සේනානායක ම.වි.**



**කළුතර දිස්ත්‍රික්කය - පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වාද්දුව මධ්‍ය මහා විද්‍යාලය**



## 5.7.වෙනත් ව්‍යාපෘති

### (i) පුනරුදය පාරිසරික සංරක්ෂණ ජාතික වැඩසටහන

ජනාධිපති ලේකම් කාර්යාලයේ මුල්‍යමය දායකත්වය මත පුනරුදය පාරිසරික සංරක්ෂණ ජාතික වැඩසටහන 2016 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව පස හා ජලය සංරක්ෂණය කිරීමත්, ජල මූලාශ්‍ර සංරක්ෂණය සඳහාත් මෙම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක සැලැස්මක් සකස් කර පුනරුදය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට මේ තුලින් බලාපොරොත්තු වේ.

- ජලපෝෂක ප්‍රදේශ සංරක්ෂණය
- පස සංරක්ෂණ ක්‍රම ස්ථාපිත කිරීම
- භූමි හායනය වැළැක්වීම
- භූමි ඵලදායිතාවය ඉහළ නැංවීම
- තිරසාර භූමි භාවිතා ක්‍රම ප්‍රචලිත කිරීම
- ගොවි අදායම ඉහල නැංවීම

2017 වර්ෂයේ දිස්ත්‍රික්ක 23 ක පුනරුදය ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබීය. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 215 ක භූමිය සංරක්ෂණය, ආරක්ෂා කිරීම හා භූමි පරිහරණය වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 51 ක් පමණ වෙන්කර තිබුණි.

මෙම වැඩසටහන මඟින් ජලපෝෂක ප්‍රදේශ, ගං ඉවුරු හා වැව් රක්ෂිත වැනි අත්‍යාවශ්‍යයෙන්ම සංරක්ෂණය කළයුතු ප්‍රදේශත්, පාංශු සංරක්ෂණය කළයුතු හා කෘෂිකාර්මික ගෙවතුවල පස සංරක්ෂණ කටයුතු ඉතාමත් සාර්ථක ක්‍රියාවට නැංවිය. මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය දැක්වෙන ඡායාරූපමෙහි පහත දැක්වේ.

**රත්නපුර දිස්ත්‍රික්කය ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**





### රත්නපුර දිස්ත්‍රික්කය - ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



### නුවරඑළිය දිස්ත්‍රික්කය - හගුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය









කළුතර දිස්ත්‍රික්කය - මදුරාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



මාතර දිස්ත්‍රික්කය - කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

පෙර තත්ත්වය





පසු තත්ත්වය









## (ii) වේලිඔය ව්‍යාපෘතිය

2015 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරිය විසින් උඩවලව ජලාශයේ ඉහළ ජලපෝෂක ප්‍රදේශය ඇතුළත් කලාපය සඳහා (බදුල්ල, මොනරාගල, රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක) භූමි පරිහරණ සිතියමක් හා පරිසර සංරක්ෂණ නිර්දේශ ඉදිරිපත් කරන ලෙස මෙම දෙපාර්තමේන්තුවට පවරන ලදී. ඒ අනුව මෙම සංවේදී ජලපෝෂක ප්‍රදේශයේ භූමි භාවිතය සඳහා නිර්දේශ ලබාදීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදුකරන ලදී. පුනරුදය පාරිසරික සංරක්ෂණ ජාතික වැඩසටහනට වෙන්කළ ප්‍රතිපාදන යටතේ මධ්‍යම පරිසර අධිකාරිය විසින් මේ සඳහා මිලියන 04 ක මුලාධාර සපයන ලදී.

මෙම ව්‍යාපෘතිය මඟින් පහත අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ලදී.

I. පාරිසරික සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම
II. නායයාම අවධානම් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම
III. මැණික්, වැලි හා කැණීම් ප්‍රදේශ හඳුනා ගැනීම
IV. 60% වැඩි බෑවුම් සහිත ප්‍රදේශ හඳුනා ගැනීම
V. නියඟය වැනි ස්වභාවික උවදුරු නිසා පීඩා විඳින ප්‍රදේශ හඳුනා ගැනීම
VI. වනජීවී රක්ෂිත ප්‍රදේශ හඳුනා ගැනීම

## (iii) ඉඩම් බැංකු ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාවේ ඉඩම් පිළිබඳ සම්පූර්ණ විස්තර එක්රැස් කිරීමත් ඒ අනුව ඉඩම් පරිහරණ සැලසුම් ක්‍රියාවලිය උප ක්‍රියාවලින් 04 කට වෙන්කර එනම් දත්ත රැස්කිරීම, දත්ත වර්ගීකරණය කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම හා පසුවිපරම් හා පුහුණුව යනාදී වශයෙන් පරිගණක මෘදුකාංග පද්ධතියක් සකස් කිරීමට ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය (ICTA) සහභාගිත්වය ඇතිව වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙමගින් ඉඩම් පරිහරණ සැලසුම් කරන ක්‍රියාවලිය පරිගණකගත පද්ධතියක් ලෙස එළි දැක්වීම සිදුකරනු ඇත.

## (iv) හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සඳහා භූමි ප්‍රතිස්ථාපන සැලසුම් සැකසීම

මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මඟින් ලෝක අහාර හා කෘෂිකර්ම සංවිධානයේ (FAO) ප්‍රදානයක් මත මධ්‍යම කඳුකරයේ බදුල්ල , මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කවල තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ සඳහා සහභාගිත්ව ක්‍රමවේදය අනුගමනය කරමින් හායනයට පත් කෘෂිකාර්මික ඉඩම් නැවත පුනරුත්තාපන කිරීම සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

ඒ අනුව තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂක 32 ක් සඳහා සැලසුම් සැකසීමට නියමිත අතර එහි ආරම්භක පියවරක් ලෙස ඉහත දිස්ත්‍රික්ක 03හි ක්ෂුද්‍ර ජල පෝෂක 08 ක් සඳහා සැලසුම් සැකසීමේ මූලික කටයුතු 2017 අවසන් කාර්තුවේ දී ආරම්භ කරන ලදී. නුවරඑළිය දිස්ත්‍රිකයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ක්ෂුද්‍ර ජල පෝෂකයක් සඳහා ක්ෂේත්‍ර අධ්‍යයනයන්ගෙන් පසු ඉඩම් පරිහරණ සැලැස්මක් කෙටුම්පත්කර අදාළ පාර්ශවකාර ආයතනවල අදහස් ලබා ගැනීමද සිදුකරන ලදී. ඒ අනුව සැලසුමේ වැඩිදියුණු කිරීම් සිදුකරගෙන යනු ලබන අතරම, සමහර නිර්දේශ අදාළ පාර්ශවකාර ආයතන මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවරද ගෙන ඇත. මෙම අත්දැකීම් මත ඉතිරි ක්ෂුද්‍ර ජලපෝෂක සඳහා මේ වර්ෂය තුළදී කඩිනමින් ඉඩම් පරිහරණ සැලසුම් සැකසීමට අපේක්ෂා කෙරේ.

### (v) කලාඔය ගංගා ද්‍රෝණිය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය අරමුණුකර ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම

පරිසර සංවේදී ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය හා පාරිසරික පද්ධති සේවාවන්හි පැවැත්ම තහවුරු කිරීමේ ව්‍යාපෘතිය ගෝලීය පරිසර පහසුකම් සැපයීමේ සංවිධානයේ (GEF) ප්‍රතිපාදන මත මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මඟින් තාක්ෂණික සහාය ලබා දෙනු ලබන අතර මෙම ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ව්‍යාපෘති යෝජනාවට අනුව නියමු ව්‍යාපෘතියක් ලෙස කලාඔය ගංගා ද්‍රෝණිය සඳහා ජෛව විවිධත්ව සංරක්ෂණය වන අයුරින් ඉඩම් පරිහරණ සැලැස්මක් සැකසීම යෝජනා කර තිබු අතර, එම කාර්යය ප්‍රධාන වශයෙන් මෙම දෙපාර්තමේන්තුවට පවරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේදී එම කටයුතු ආරම්භ කළ අතර 2016 සහ 2017 වර්ෂ තුලදී අවශ්‍ය උපකරණ මිලදී ගැනීම, නිලධාරීන් පුහුණු කිරීම සහ අදාළ ක්ෂේත්‍ර කටයුතු නිම කරන ලදී. අදාළ පාර්ශව කාර ආයතනවලද සහයෝගය ඇතිව රැස්කරන ලද දත්ත හා තොරතුරු පදනම් කර එම ගංගා ද්‍රෝණිය සඳහා වන ඉඩම් පරිහරණ සැලැස්ම මේ වන විට සකස් කිරීම අවසන් කර ඇත. මේ වසරේ මාර්තු මාසය තුළ එම සැලැස්ම මුද්‍රණය කර එළි දැක්වීමට අපේක්ෂා කෙරේ.

## 5.8. දිස්ත්‍රික් මට්ටමෙන් ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය

2017 වර්ෂයට අදාලව දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය වගුවෙන් දැක්වෙන අතර එය ප්‍රස්ථාරිකව ද වැඩිදුරටත් පැහැදිලි කොට ඇත.

**<u>දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක වැඩසටහන්වල ප්‍රගතිය -2017</u>**

| වැඩසටහන | ඉලක්කය | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් | 100 | 78 |
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් | 300 | 300 |
| ග්‍රාමීය ඉඩම් පරිහරණ සැලසුම් කිරීම | 300 | 300 |
| පාසල් සිසුන් හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 300 | 300 |
| ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණ (සිතියම් ගණන) | 1831 | 1831 |
| ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් නිර්දේශ ක්‍රියාත්මක කිරීම (වැඩසටහන් ගණන) | 50 | 50 |

